**ශීර්ෂය - 166 ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 166 - ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 මැයි 31 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ජල සම්පාදන හා වතුයටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයේදී හඳුනාගත් වටිනාකම රු. මිලියන 1.3 ක් වූ භාණ්ඩ ඒකක 155 ක් 2023 මාර්තු 15 දින අපහරණය හා වෙන්දේසි කර තිබුණද, එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබුණි. | 2022 වර්ෂයට අදාළ අපහරණ භාණ්ඩවල වටිනාකම ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට අදාළව නිලධාරින්ට උපදෙස් දෙන ලදි. | ස්ථාවර වත්කම්වල නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |
| (ii) | අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ නමුත් ස්ථාවර වත්කම් ලෙස දක්වා තිබූ එකතුව රු.මිලියන 10 ක් වූ මෝටර් වාහන 03 ක් 2023 මාර්තු 09 දින නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය වෙත ලබා දී තිබුණද, එම වත්කම්වල පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත්කර නොතිබුණි. | මෙම වාහන 03 හි පිරිවැය ස්ථාවර වත්කම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කර ඇත. | සිදු වී ඇති ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුයි. |
| (iii) | අමාත්‍යාංශය විසින් පරිහරණය කල වෙනත් ආයතනය නමින් ලියාපදිංචි කර තිබූ වටිනාකම රු.මිලියන 46 ක් වූ වාහන 13 ක් අමාත්‍යාංශයේ වත්කම් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ACA-6 ප්‍රකාශයේ මූල්‍ය නොවන වත්කම් ශේෂය රු.මිලියන 46 ක් වැඩියෙන් දක්වා තිබුණි. | මෙම වාහන පවරා ගැනීමට අදාල තොරතුරු කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යොමුකර වසරකට අධික කාලයක් ගත වුවද ඒ සඳහා අනුමැතිය මේ වන තුරු ලැබී නොමැත. අමාත්‍යාංශය වෙත අයිතිය මාරු වී ඇති වාහනවල වටිනාකම් පමණක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම සඳහා උපදෙස් දෙන ලදී. | අයිතිය තහවුරු නොවූ වත්කම්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවලින් ඉවත්කර නිවැරදි වටිනාකම සටහන් කළ යුතුයි. |

| | | | |
|---|---|---|---|
| **(iv)** | හිටපු රාජ්‍ය අමාත්‍යවරයාට රාජකාරී කටයුතු වෙනුවෙන් ලබා දී තිබූ රු.මිලියන 1.4 ක් වටිනා කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රය හා ලැප්ටොප් පරිගණකය 2022 මැයි 09 දින රටේ පැවති අර්බුදකාරී තත්ත්වය මත විනාශ වී තිබූ අතර 2024 මැයි 20 වන විටත් පොත්වලින් ඉවත්කිරීමට භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබූ නිසා මූල්‍ය ප්‍රකාශනවල, මූල්‍ය නොවන වත්කම් වටිනාකම රු.මිලියන 1.4 කින් වැඩියෙන් දක්වා තිබුණි. | වත්කම්වල වටිනාකම පොත්වලින් කපා හැරිමට මු.රෙ 104 ප්‍රකාරව අනුමැතිය භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු අතර එම අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව පොත්වලින් ඉවත් කරන බව දන්වමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදු කළ යුතුයි. |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය සතු සියලුම වාහනවල තොරතුරු ඇතුලත් යාවත්කාලීන කරන ලද වාහන ලේඛණයක් නඩත්තු කර නොතිබුණු අතර විගණන නියැදි පරීක්ෂාවට භාජනය වූ 2023 ඔක්තෝම්බර් 31 දින වන විට ලේකම්, ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් අමාත්‍යාංශය නමින් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී තිබූ වාහන 264 ක් සම්බන්ධයෙන් තොරතරු ඉහත පරිදි ලේඛන ගත කර නොතිබුණි. | ජල සම්පාදන අංශය සඳහා හැකි ඉක්මනින් අදාළ ලේඛනය සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලේඛනයක් යාවත්කාලීනව පවත්වා ගෙන යා යුතුයි. |

**(ඇ) විගණන සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය යටතේ ඇති ආයතන විසින් මිලදී ගෙන අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචි කර තිබූ වාහන 69 කට අදාල ලියාපදිංචි කිරිමේ සහතික අමාත්‍යාංශය සතුව නොතිබුණි. | මෙම වාහන 69 අතුරින් වාහන 63 කට අදාළ ලියාපදිංචි සහතික අදාළ ආයතන වෙත මාරු කිරීම සඳහා MT06 පෝරම සමඟ අප වෙත ලැබී ඇත. ඉතිරි වාහන 06 පිළිබඳව කඩිනමින් සොයා බලා වාර්තා කිරීමට කටයුතු කෙරේ. | අමාත්‍යාංශයේ නමින් ලියාපදිංචි කර ඇති වාහනවල ලියාපදිංචි කිරිමේ සහතික අමාත්‍යාංශය සතුව තබා ගැනීමටත්, එම වාහනවල භෞතික පැවැත්ම වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මගින් තහවුරු කර ගැනිමටත් කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිපූරක ප්‍රතිපාදන වෙන්කර ගැනීම මුදල් රෙගුලාසි 74 ප්‍රකාරව නිසි සැළකිල්ලෙන් යුතුව සිදු නොකිරීම හේතුවෙන් 2023 වර්ෂයේ අඹතලේ ජල සැපයුම් පද්ධතිය වැඩි දියුණු කිරිම සහ බල ශක්ති සංරක්ෂණ ව්‍යාපෘති වැය විෂය අංක 166-02-05-87-2201/11 යටතේ වෙන්කර තිබූ පරිපූරක ප්‍රතිපාදනය වූ රු.මිලියන 2,106 ක මුදලින් රු.මිලියන 816 ක් උපයෝජනය කර නොතිබුණි. | නල මාර්ගය පිරිසිදු කිරීම සහ විෂබීජහරණය කිරීම සඳහා ජලය අත්හිටුවීම අනුමත කරගැනීමට සැලසුම් කළ පරිදි නොහැකි වීම, රටේ පැවති ආර්ථික පසුබෑම, ඉදිකිරීම් භාණ්ඩ මිල ඉහළ යෑම සහ හිගවීම, අයහපත් කාලගුණික තත්ත්වයන් සහ AFD විසින් අරමුදල් ලබා දීම අත්හිටුවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | මුදල් රෙගුලාසි ප්‍රකාරව නිසි සැළකිල්ලෙන් යුතුව කටයුතු කළ යුතුයි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ට අනුකූලව සියලු සේවාවන් ඇස්තමේන්තුවල ඇතුලත් කර ඇති බවට සහ මුදල් වර්ෂය තුල ඉටු කලහැකි බවට නිසි සැලකිල්ලෙන් යුක්තව ඇස්තමේන්තු සම්පාදනය කර තිබෙන බවට ගණන්දීමේ නිලධාරියා වගකිව යුතු වුවද 2023 වර්ෂය සඳහා පිළියෙල කල ඇස්තමේන්තුවේ වැය විෂයන් 31 ක සියයට 15 සිට 100 දක්වා පරාසයක වූ එකතුව රු.මිලියන 20,907 ක ඉතිරි වීම් නිරීක්ෂණය විය. | රාජ්‍ය වියදම් කළමණාකරන හා වියදම් පාලනය පිළිබඳ චක්‍රලේඛය, අයහපත් කාලගුණය, ඉඩම් අයිතිය පිළිබඳ ගැටලුව, ඉංජිනේරු ඇස්තමේන්තුවට වඩා ටෙන්ඩර් ප්‍රදානය කරන ලද මිල ගණන් අඩුවීම, ද්‍රව්‍ය මිල ගණන් වැඩිවීම, චීන රජයෙන් ආධාර නොලැබීම, නව ව්‍යාපෘති ආරම්භ නොකිරීම සහ ණය අත්හිටුවීම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි විය. | රාජ්‍ය අයවැය නිසි පරිදි කළමනාකරණය කර ගැනීමට අවශ්‍ය සහය දැක්විය යුතුය. |
| (ඇ) | විෂයභාර ඇමතිතුමාගේ කටයුතු සඳහා වෙන්කරනු ලබන වාර්ෂික ප්‍රතිපාදන මගින් ඇමතිතුමා සහ කාර්යමණ්ඩලය වෙනුවෙන් වෙන් කරන ලද වාහන සඳහා වූ ඉන්ධන වියදම් දැරිය යුතු වුවත්, ඇමතිතුමාගේ මාධ්‍ය අංශය විසින් අමාත්‍යාංශයේ සංචිත වාහන භාවිතා කර ඒ සඳහා 2023 වර්ෂයේ එකතුව රු.මිලියන 1.72 ක් වූ ඉන්ධන ලීටර් 5,226 ක වියදම්, අමාත්‍යාංශයේ පරිපාලන වියදම් වැය ශිර්ෂ මගින් වැයකර තිබුණි. | අමාත්‍යතුමාගේ මාධ්‍යාවරණ කණ්ඩායම් විසින් සංචිත වාහන ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්වලදී වාහන ලබාදිමට ක්‍රියාකර ඇත. මින් ඉදිරියට වැඩසටහන්වලට අදාළ ලියකියවිලි ඉදිරිපත් නොකළහොත් මුදල් ප්‍රතිපූරණය කිරීමට හෝ වාහන ලබාදීමට කටයුතු නොකරන බව දන්වමි. | අනුමත ප්‍රතිපාදන සීමාවන් ඉක්මවා සිදු කරන ලද වැය කිරීම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | | **වටිනාකම රු.** | **අනුකූල නොවීම** | | |
| **(අ)** | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| (i) | මුදල් රෙගුලාසි 103(1)(අ) | - | ජල සම්පාදන අමාත්‍යවරයා වෙත වෙන් කර තිබූ මෝටර් රථය 2023 ඔක්තෝම්බර් 22 දින අනතුරකට ලක්වීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ නිළධාරීන් දැනුවත් කිරීම, 2023 නොවැම්බර් 15 දින එනම් සති 03 කට පසුව සිදුකර තිබුණි. | මෙම අනතුර සම්බන්ධව 2023 ඔක්තෝම්බර් 22 දින අමාත්‍යාංශයේ ප්‍රවාහන නිලධාරී දැනුවත් කර ඇත. | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 108(3) | රු.මිලියන 13.5 | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 2.1 ඡේදය ප්‍රකාරව හානිය අමාත්‍යාංශ ලේකම්වරයාගේ සීමාව ඉක්මවා තිබූ නමුත් රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කර නොතිබුණි. | මේ වන විට රථය ගැලවීමේ කටයුතු නියෝජිත ආයතනය තුල සිදු කරමින් පවතී. කාර්යය අවසන් වන විට අවසාන ඇස්තමේන්තුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට, ඇස්තමේන්තු වටිනාකම නිශ්චිතව නියෝජිත ආයතනය විසින් | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | එවිය යුතුය. | |
| (iii) | මුදල් රෙගුලාසි 1647(ආ) | - | මුදල් රෙගුලාසි ප්‍රකාරව අමාත්‍යාංශයේ වාහන හා ඒවායේ උපකරණ පිළිබඳව සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | 2024 වර්ෂයේදී වාහන සමීක්ෂණයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. | -එම- |
| (iv) | මුදල් රෙගුලාසි 1646 | - | අමාත්‍යාංශයේ ජල සම්පාදන අංශයේ සංචිතය සතු වාහන 16 කට අදාළව 2023 ජනවාරි සිට 2023 ඔක්තෝම්බර් දක්වා වූ ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙම වාහන සම්පූර්ණ වර්ෂය පුරාම භාවිතයට ගෙන නොමැති අතර අලුත්වැඩියාවන් සඳහා යෙදවීම් නිලධාරීන්ට අනුයුක්ත කිරීම් ආදිය හේතුවෙන් ධාවන සටහන් නොමැති මාස තිබුණි. | -එම- |
| (v) | මුදල් රෙගුලාසි 757(2)(අ) | 659,473 | භාණ්ඩ සමීක්ෂණයේදි හඳුනාගෙන තිබූ රාජ්‍ය අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශයේ අංශ 03 ක භාණ්ඩ ඌනතා හා අතිරික්තතා පිළිබඳ මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | 2023 දෙසැම්බර් 31 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තා සැලකිල්ලට ගෙන පවතින වෙනස්කම් නිරාකරණය කර ගැනීම සඳහා කටයුතු සිදු කරන බව සඳහන් කරමි. | -එම- |
| **(ආ)** | 2006 ජූලි 14 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 11/2006 හි 03(ix) ඡේදය | 60,204 | චක්‍රලේඛ උපදෙස් වලට පටහැනිව අදාළ නිළධාරියෙකු විසින් අනුමත සීමාව ඉක්මවා ධාවනය කළ කිලෝමීටර් 1038 ට අදාළව ඉන්ධන වියදම් සඳහා රජයේ මුදල් අවභාවිතා කර තිබුණි. | මේ සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වේ. මෙම රථය ලේකම් කාර්යාලයේ රාජකාරී සඳහා ප්‍රමුඛතා පදනම මත ලබා දී ඇත. ලේකම්තුමා විසින් | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | පවරන රාජකාරී සඳහා අදාළ රථය භාවිතා කර ඇති බැවින් එම ධාවන සටහන් සඳහා ලේකම්තුමාගේ සම්බන්ධීකරණ ලේකම් විසින් සිය අත්සන යොදා ඇත. | |
| **(ඇ)** | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 2.5 ජේදය | රු.මිලියන 1.5 | 2022 වර්ෂයේ රු. මිලියන 1.4 ක් වටිනා කාර්යාලීය උපකරණවලට සිදුවූ හානිය සහ 2023 වර්ෂයේ වාහන 02 කට සිදු වූ රු.97,200 ක්වූ අලාභහානි සම්බන්ධයෙන් පොදු 284 අනුව අවසාන වාර්තාව ලබා දී නොතිබුණි. | කාර්යාලීය උපකරණ විනාශ වීම පිළිබඳව මු.රෙ. 104(4) පරීක්ෂණ වාර්තාව මහා භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කරමින් පවතී. අනෙකුත් වාහන 02 සඳහා පොදු 284 අනුව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව ට දැනුම් දීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**2.3 අවිධිමත් ගනුදෙනු**

**(i) අධිකාර බලය නොමැති ගෙවීම්**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශ ලේකම් කාර්යාලයේ ධාවනය සඳහා යොදවා තිබූ වාහනයක මයිලෝමීටරය අනුව ධාවනය කල දුර අතර කිලෝමීටර් 905 ක වෙනසක් තිබුණි. | මේ සම්බන්ධයෙන් මාණ්ඩලික නිලධාරියෙකුගේ ප්‍රධානත්වයෙන් මූලික පරීක්ෂණයක් පැවැත්වෙන අතර මූලික පරීක්ෂණය අවසන් වූ පසු මෙම කරුණට අදාළව කිසියම් අක්‍රමිකතාවයක් සිදුව ඇත්නම් ඊට අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කරනු ලැබේ. | ධාවන සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන යා යුතු අතර නිසි අනුමැතියක් නොමැතිව වාහන භාවිතා කිරීම සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) වතුයටිතල පහසුකම් සංවර්ධන අංශයට අයත් නොවන වාහන 05 ක් සඳහා ඉන්ධන ලීටර් 373 ක්ද වැව්ලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියට තාවකාලිකව වෙන් කරන ලද වාහනයක් වෙනුවෙන් ඉන්ධන ලීටර් 20 ක්ද අමාත්‍යාංශය විසින් සපයා තිබූ බව අනාවරණය වී තිබුණි. | ඇමතිතුමාගේ මාධ්‍යාවරණ රාජකාරි සඳහා ලබාදී ඇති වාහනය අලුත්වැඩියා කිරීමේ අවස්ථාවන්වලදී ඒ වෙනුවට තාවකාලිකව වාහන ලබාදී ඇති අතර ඒ සඳහා මෙම අංශය මගින් ඉන්ධන නිකුත් කර ඇත. | අමාත්‍යාංශයේ වාහන පරිහරණයට අදාළ චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව සිදුකළ යුතුය. |

## 2.4 තැන්පත් ශේෂයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් රෙගුලාසි 571(3) ප්‍රකාරව තැන්පත් කළ දින සිට වර්ෂ 2 ක් ඉකුත් වූ තැන්පතු රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කල යුතු වුවත් 6000-0-0-16-0-82 අංක දරන තැන්පතු ගිණුමේ අවස්ථා 16 ක එකතු වටිනාකම රු. මිලියන 5.05 ක් හා 6000-0-0-13-0-88 අංක දරන තැන්පතු ගිණුමේ වටිනාකම වන රු.30,000 ක මුදල සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි. | අංක 6000-0-0-16-0-82 දරණ තැන්පතු ගිණුමේ පවතින රැඳවුම් මුදල් නිදහස් කරගැනීමට අදාළ ආයතන වෙත සිහිකැඳවීම් යොමුකර ඇත. අංක 6000-0-0-13-0-88 දරණ තැන්පතු ගිණුමේ රු.30,000 ක මුදල නිදහස් කිරීමට අවශ්‍ය ලේඛන යොමුකරන ලෙස අදාළ ආයතනය දැනුවත් කර ඇත. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 සැලැසුම් කිරීම

වතුයටිතල පහසුකම් සංවර්ධන අංශයේ 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම හා ප්‍රගතිය පරීක්ෂාවේදී පහත කරුණු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැළැස්ම මගින් හඳුනාගෙන තිබූ නිවාස වැඩසටහනෙහි කටයුතු මෙහෙයවීම හා සුපරීක්ෂණය වෙනුවෙන් වෙන්කර තිබූ රු.මිලියන 2 ක ප්‍රතිපාදනයෙන් කිසිදු මුදලක් වැයකර නොතිබුණි. එමෙන්ම ප්‍රතිලාභීන් 200 ක් සඳහා ඉඩම් ලබා දීමට සැලසුම්කර තිබුණද ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම ප්‍රතිලාභීන් 101 කට එනම් සියයට 50 ක් තරම් වූ අවම මට්ටමක පැවතුණි. | නිවාස ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන වර්ෂය තුළ සම්පූර්ණයෙන් අවසන් වී තිබූ බැවින් ඔප්පු ප්‍රදානය සඳහා වෙන් කල ප්‍රතිපාදන නිවාස ව්‍යාපෘතීන්හි වියදම් පියවීම සඳහා යොදා ගැනීමට සිදු විය. මෙම හේතුව නිසා වර්ෂය තුළ ඉඩම් ඔප්පු ප්‍රදානය කිරීම අවම මට්ටමක පැවතුණි. | ක්‍රියාකාරි සැලැස්මෙහි ඇතුලත් වැඩසටහන් නියමිත කාලය තුල ඉටු කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | හැටන් හි පිහිටි වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා අවශ්‍ය උපකරණ ස්ථාපිත කිරීම වෙනුවෙන් රු.මිලියන 33 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණි. 2023 වර්ෂය අවසාන වන විට අපේක්ෂිත මුදල ඉක්මවා එනම් රු.මිලියන 56.11 ක් වැයකර ගොඩනැගිල්ලේ ඉදිකිරීම් පමණක් සම්පූර්ණ කර තිබුණු අතර යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම විගණන දිනය වූ 2024 අප්‍රේල් 10 දින වන විටත් සිදුකර නොතිබුණි. | මෙම ව්‍යාපෘතිය ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය හා එම කාර්යාලය විසින් තෝරා ගන්නා ලද කොන්ත්‍රාත් ආයතන සමග සිදු කරන අතර, අප අමාත්‍යාංශයෙන් සිදු කරනු ලබන්නේ ගිවිසුම් ප්‍රකාරව රේගු බදු හා වැට් බදු ගෙවීම, ව්‍යාපෘතිය සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණයයි. | ව්‍යාපෘතිය අවසන්කර ගැනීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණය නිසි පරිදි සිදු කල යුතුයි. |

## 3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කුරුණෑගල දිස්ත්‍රික්කයේ කසුන්ගම, නාරම්මල සිසිල ප්‍රජා මූල සංවිධානයෙහි ඉදිකල යුතුව තිබූ නල ළිඳ භාවිතයට ගත නොහැකිව අත්හැර දමා තිබුණ බැවින් ඒ වෙනුවෙන් වැයකර තිබූ රු. මිලියනයක වියදම අනාර්ථික වියදමක් බවට පත්ව තිබුණි. | මෙම නල ළිඳ අසාර්ථක වුවද ජල සම්පත් මණ්ඩලය මගින් නල ළිඳක් ඉදිකිරීමේ ගිවිසුම ප්‍රකාරව ඉදිකිරීමේ ඇස්තමේන්තුගත මුදලින් සියයට 75 ක් අයකරන බව සඳහන් කර තිබීමෙන් එම කාර්යය වෙනුවෙන් අමාත්‍යාංශයට ගෙවීම් කිරීමට සිදුවිය. | නල ළිඳ ඉදිකිරීම සඳහා ස්ථානය තෝරාගැනීම වෙනුවෙන් භූ විද්‍යා සමීක්ෂණයක අවශ්‍යතාවය පවතින බැවින් එම කාර්යය නිසි පරිදි සිදුනොවීම තුල රජයට වන පාඩුව එම කටයුත්ත නිසි පරිදි සිදු නොකරන ලද ආයතන හෝ නිලධාරින් විසින් දැරිය යුතුය. |
| (ආ) | කෑගල්ල දිස්ත්‍රික්කයේ 2016 වර්ෂයේදී නායයෑමෙන් අවතැන් වූ ගම්මාන සඳහා ජල පහසුකම් සැපයීමේ අරමුණින් ආරම්භ කල ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 75.2 ක් වූ හබලක්කාව ජල සම්පාදන ව්‍යාපෘතියෙහි කාර්යයන් 06 ක් සඳහා 2023 වර්ෂය තුල රු.මිලියන 19.3 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණද 2023 දෙසැම්බර් 31 දිනට එම කාර්යයන් ඉටු කිරීමේ භෞතික ප්‍රගතිය සියයට 10 සිට සියයට 80 දක්වා වූ පරාසයක විය. | හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතිය මගින් බෙදා හැරීමේ නල එළීම ආරම්භ කල බැවින් මෙම ව්‍යාපෘතියට බෙදා හැරීමේ නල එළීමට කටයුතු කරන ලදී. දැනට ප්‍රතිලාභීන් සඳහා ජල සම්බන්ධතා ලබා දීමට සූදානම් කර ඇත. මෙම ව්‍යාපෘතිය සඳහා ලබා ගන්නා ලද පොම්ප දන්දෙනිය වත්ත ජල සම්පාදන ක්‍රමය සඳහා භාවිතා කරනු ලැබේ. | මෙම ව්‍යාපෘති නිමකර ප්‍රතිලාභින්ගේ අවශ්‍යතාව කඩිනමින් ඉටුකර ගැනිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශය මගින් සැලසුම් කරන ලද වකුගඩු රෝග නිවාරණ වැඩසටහන යටතේ ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවට ලැබී තිබූ රු.මිලියන 18.18 ක් වටිනා EDR පිරිපහදු යන්ත්‍ර 2 ක් 2023 දෙසැම්බර් 31 දින වන විට පුත්තලම දිස්ත්‍රික්කයේ පුලිච්චාකුලම ජල ව්‍යාපෘතියට ස්ථාපිත කිරිම සඳහා රු.මිලියන 24.3 ක් වෙන්කර තිබුණද 2023 දෙසැම්බර් 31 වන විටත් එම කාර්ය අවසන් කර නොතිබුණි. | අදාල බිල්පත් ප්‍රජා මූල සංවිධානය මගින් ඉදිරිපත් නොකරන ලද බැවින් මූල්‍ය ප්‍රගතිය පසුබෑමට ලක්විය. මේ වන විට EDR පද්ධති දෙක ස්ථාපිත කර අවසන් අතර, විදුලිය බල මණ්ඩලය මගින් අදාල ට්‍රාන්ස්පෝමරය සවිකර විදුලිය ලබා දුන් පසු ක්‍රියාත්මක කල හැකිය. | මෙම ජල ව්‍යාපෘතිය කඩිනමින් නිමකිරීමට අවශ්‍ය කටයුතු කල යුතුය. |
| (ආ) | ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය (අදියර 01) යටතේ රු.මිලියන 100 ක ප්‍රතිපාදන වෙන්කර නිවාස ඒකක 154 ක් සම්පූර්ණ කිරීමට සැලසුම් කර තිබුණද, 2023 වර්ෂය අවසාන වන විට නිවාස ඒකක 16 ක් පමණක් සම්පූර්ණ කර තිබුණි. | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම තීරණය කරනු ලබන්නේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය මගින් වන අතර, මේ වනවිට මෙම නිවාස ඒකක 154 න් ඉදිකිරීම් කටයුතු කිරීමට ඇත්තේ නිවාස ඒකක 70 ක පමණක් බව වාර්තා කරමි. | අපේක්ෂිත භෞතික ඉලක්ක කඩිනමින් ළඟාකර ගැනිමට අවශ්‍ය සම්බන්ධිකරණ කටයුතු අමාත්‍යාංශය විසින් සිදුකල යුතුයි. |
| (ඇ) | ඉන්දියානු ආධාර යටතේ ඉදිකළ නිවාස ඒකක 181 ක් සඳහා යටිතල පහසුකම් සැපයීමට රු.මිලියන 25 ක ප්‍රතිපාදන සලසා තිබුණද වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 24.77 ක් එනම් සියයට 99 ක්ම වැයකර යටිතල පහසුකම් ලබාදී තිබුණේ මුළු නිවාස 111 කට පමණි. | මෙම නිවාස ඉදිකරනු ලබන්නේ ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසිනි. ඉදිකිරීම් කටයුතු අවසන් වූ පසු යටිතල පහසුකම් සැපයීමට කටයුතු කරන අතර යටිතල පහසුකම් සැපයීම ද ප්‍රමාද වී ඇති බව පිළිගනිමි. | අපේක්ෂිත භෞතික ඉලක්ක ළඟාකර ගත යුතුය. |
| (ඇ) | 2023 වර්ෂය තුළ ස්මාට් පන්තිකාමර 60 ක් ස්ථාපිත කිරීම සඳහා රු.මිලියන 155 ක් වෙන්කර තිබුණද, ඉන් කිසිදු මුදලක් වැයකර නොතිබූ අතර ඒ සඳහා අවශ්‍ය පාසල් තෝරාගැනීමේ කටයුතු හා ගිවිසුම්ගත වීමේ කටයුතුද අවසන් කර නොතිබුණි. | ප්‍රතිපත්ති වෙනස්වීම මත මෙම ව්‍යාපෘතියේ විෂය පථය වෙනස් වීමක් සිදු වූ අතර ඒ අනුව නැවත අවබෝධතා ගිවිසුම වෙනස් කිරීමට සිදු විය. මේ වන විට මෙම අවබෝධතා ගිවිසුම සකස් කර ඉන්දියානු රජයේ අනුමැතිය ලබාගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | අපේක්ෂිත භෞතික ඉලක්ක ළඟාකර ගැනිම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු නිසි පරිදි සිදුකල යුතුයි. |

## 3.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් 2017, 2018 හා 2021 වර්ෂයන්වලදී ක්‍රියාත්මක කර තිබූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 435.77 ක් වූ නිවාස ව්‍යාපෘති 19 ක රු.මිලියන 82.12 ක මූලික අත්තිකාරම් මුදලක් හා කළමණාකරණ ගාස්තු වෙනුවෙන් රු.මිලියන 3.6 ක මුදලක්, වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවා තිබුණ නමුත් එම මුදල් ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. එමෙන්ම මෙම කොන්ත්‍රාත්තුව වෙනුවෙන් කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. | ක්‍රියාත්මක නොකරන ලද ව්‍යාපෘති 19 ක් සඳහා ගෙවන ලද මුදල් රජයට වාසිදායක වන අයුරින් ආවරණය කර ගැනීමට අවශ්‍ය වූ බැවින් අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත ගෙවීමට තිබූ අනෙකුත් ව්‍යාපෘතිවල බිල්පත් වෙනුවෙන් හිලව් කරන ලද බව වාර්තා කරමි. | ප්‍රතිපාදන වෙන්කල අරමුණ ඉටුකර ගැනිම සඳහා නිලධාරීන් වගකීමෙන් යුතුව කටයුතු කළ යුතුයි. |

## 3.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) මැණික්කඩවර හා මහපල්ලේගම ප්‍රජා ජල ව්‍යාපෘතිය 2019 වර්ෂයේ ආරම්භ කර තිබූ නමුත් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ භූ සමීක්ෂණ වාර්තා අනුව භූමිය එම ඉදිකිරිම් කටයුතු සඳහා සුදුසු නොවන බව දක්වා තිබුණද එම උපදෙස් අනුව කටයුතු කර නොතිබුණු බැවින් ඉඩම නායයාම හේතුවෙන් 2024 මාර්තු වන විට ව්‍යාපෘතිය වෙනුවෙන් වැයව තිබූ රු. මිලියන 33ක් නිශ්කාර්ය වියදමක් බවට පත් වී තිබුණි. | මේ සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය මගින් නැවත නිර්දේශ ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. එබැවින්, මෙම නිර්දේශ ලැබෙනතුරු ඉදිකිරීම් මේ වන විට තාවකාලිකව නවතා ඇති අතර NBRO වාර්තා නිර්දේශයන්ට අදාලව කටයුතු කිරීමට සැලසුම් කරමින් ඇත. | නිසි ශක්‍යතා අධ්‍යයනයකින් තොරව සහ ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන ලබා දී තිබූ නිර්දේශ නොසලකා ව්‍යාපෘතිය ආරම්භ කිරිම සම්න්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගත යුතුයි. |
| (ආ) වැවිලි මානව සංවර්ධන භාරය හා අදාල සමිති සංවිධානය සමඟ එළඹ තිබූ ගිවිසුම් ප්‍රකාරව 2016, 2017, 2018, 2019, 2020 සහ 2021 යන වර්ෂවල ආරම්භ කර තිබූ නිවාස ව්‍යාපෘති 62 ක් 2023 දෙසැම්බර් 31 දින වන විටත් නිමකර නොතිබුණි. නමුත් එම ව්‍යාපෘතිවල කොන්ත්‍රාත්කරුවන්ට | 2016, 2017, 2018, 2019, 2020 හා 2021 වර්ෂයන්හිදී වැඩ ආරම්භ කරන ලද අවිච්ඡේද ව්‍යාපෘති සඳහා 2021 වර්ෂය සඳහා අමාත්‍යාංශයට අතිරේක ප්‍රතිපාදන නොලැබිණි. 2024 වර්ෂය සඳහා වෙන් වී ඇති රු.මිලියන 500 ක ප්‍රතිපාදන | රජයේ අරමුදල් උපරිම කාර්යක්ෂමතාවයකින් හා ඵලදායීතාවයකින් භාවිත කළ හැකි වන පරිදි අදාල කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනිම සහ එම |

| | | | |
|---|---|---|---|
| | ගෙවීම සඳහා රු.මිලියන 846.85 ක මුදලක් සහ අධීක්ෂණය හා කළමණාකරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.මිලියන 51.37 ක මුදලක් වැවිලි මානව සංවර්ධන භාරය වෙත අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | ප්‍රමාණය තුළ නිවාස ඒකක 383 ක ඉතිරි වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. | මුදල් නිසි කළමණාකරණයකින් යුතුව වැය කිරීම සඳහා නිසි වැඩ පිළිවෙළක් සකස් කළ යුතුයි. |
| (ඇ) | හරිත රන් නිවාස ව්‍යාපෘතිය යටතේ නුවර ප්‍රදේශයේ රොත්වයිල්ඩ් වතුයායේ නිවාස ඒකක 15 ක් සඳහා රු.මිලියන 3.4 ක්ද, නුවරඑළිය, හැටන්, නුවර, ගාල්ල හා රත්නපුර යන ප්‍රදේශවල නිවාස ඒකක 211 ක් සඳහා රු.මිලියන 48.2 ක්ද, තවත් නිවාස ඒකක 29 ක් සඳහා රු.මිලියන 117.2 ක්ද වශයෙන් රු.මිලියන 168.8 ක් වැයකර තිබුණද අදාල නිවාස වල ඉදිකිරීම් කටයුතු නිමකර නොතිබුණි. | 2024 වර්ෂයේ නිවාස වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා රොත්වයිල්ඩ් වතුයායේ නිවාස ඒකක 15 ක් ඇතුළත් කර ඇති බව වාර්තා කරමි. අඩක් නිම කර ඇති වතු නිවාසවල පැවති ඉදිකිරීම් අදියරයන් පදනම් කර ගනිමින් අමාත්‍යාංශය වෙත ලැබෙන ප්‍රතිපාදන සීමාව තුළ අවසන් කළ හැකි වැඩ ප්‍රමාණයන් ඉටු කිරීමට සැලසුම් කරනු ලැබේ. | මෙම නිවාස ව්‍යාපෘති කඩිනමින් නිමකර ප්‍රතිලාභ අපේක්ෂාවෙන් පසුවන ජනතාවට අවශ්‍ය සේවාව කඩිනමින් ලබාදිය යුතුයි. |
| (ඈ) | 2021 වර්ෂයේදී නව ජීවන නිවාස ව්‍යාපෘතිය යටතේ නුවරඑළිය, හැටන්, නුවර හා කෑගල්ල ප්‍රදේශවල නිවාස ඒකක 157 ක් සඳහා රු. මිලියන 92 ක් ද 2020 හා 2021 වර්ෂවලදී නුවරඑළිය, හැටන්, නුවර ප්‍රදේශයන්හි රු. මිලියන 45.6 ක් වැය කර තිබූ නිවාස ඒකක 104 ක කටයුතුද කෑගල්ල හා හැටන් යන ප්‍රදේශවල ඇස්තමේන්තු වටිනාකම රු.මිලියන 173 ක නිවාස ඒකක 56 ක කටයුතුද 2023 දෙසැම්බර් 31 වන විටත් අවසන් කර නොතිබුණි. | රටෙහි පැවති ආර්ථික තත්වය මත ගොඩනැගිලි ඉදිකිරීම් අමුද්‍රව්‍යවල මිල සීඝ්‍ර ලෙස ඉහළ යාම හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන් විසින් ඉදිකිරීම් කටයුතු නතර කරන ලදී. අඩක් නිම කර ඇති වතු නිවාසවල පැවති ඉදිකිරීම් අදියරයන් පදනම් කර ගනිමින් අමාත්‍යාංශය වෙත ලැබෙන ප්‍රතිපාදන සීමාව තුළ අවසන් කළ හැකි වැඩ ප්‍රමාණයන් ඉටු කිරීමට සැලසුම් කරනු ලැබේ. | ප්‍රමාද වූ ඉදිකිරීම් කටයුතු කඩිනමින් නිමකිරීමට කටයුතු කළ යුතුය. |

## 3.6 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කෑගල්ල දිස්ත්‍රික්කයේ දන්දෙනිය වත්ත ග්‍රාමීය ජල යෝජනා ක්‍රමය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 10 ක් වුවද එහි මුළු ඇස්තමේන්තුගත මුදල රු.මිලියන 3.66 ක් ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත ගෙවීම් කර තිබුණි. ෆෙරෝසිමෙන්ට් කුළුණක් සෑදීම සඳහා පෞද්ගලික ආයතනයක් වෙත | තුළුමං ළිඳේ ඉදිකිරීම් 2024 මැයි 31 වන විට අවසන් කිරීමට සැලසුම් කර ඇත. සම්ප්‍රේෂණ නල හා බෙදා හැරීමේ නල එළීමේ භෞතික ප්‍රගතිය 2023 දෙසැම්බර් 31 දිනට සියයට 92 ක් වන අතර රැඳවුම් මුදල්ද | අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතන විසින් සිදු කරනු ලබන ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන ලබා ගැනීම සහ නිදහස් කිරීම පමණක් |

| | | |
|---|---|---|
| ලබා දී තිබූ රු.මිලියන 7.6 ක් වූ කොන්ත්‍රාත්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය සියයට 20 ක් වුවද කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 55 ක් වූ රු.මිලියන 4.2ක් 2023 දෙසැම්බර් 29 දින වන විට ගෙවා තිබුණි. | ෆෙරෝසිමෙන්ට් කුළුණ ඉදි කිරීම සඳහා ගෙවන ලද රඳවුම් මුදල්ද නැවතත් අමාත්‍යාශය වෙත එවන ලෙස ජල සම්පාදන මණ්ඩලය වෙත ලිඛිතව දැනුම්දෙන ලදි. | සිදුනොකළ යුතු අතර එම ව්‍යාපෘති සැලසුම් කල පරිදි ක්‍රියාත්මක කිරිම අමාත්‍යාංශ අධීක්ෂණය නිසි පරිදි සිදුවිය යුතුයි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය අසාර්ථක විමට සහ අපේක්ෂිත ප්‍රගතියක් නොමැතිව වැඩිපුර ගෙවීම් කිරිම ව්‍යාපෘති නිම නොවී සහ ඇප සුරක්ෂණයක් නොමැතිව රදවාගත් මුදල් නිදහස් කිරිම යනාදිය සඳහා වගකිව යුතු නිළධාරීන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.7 ප්‍රසම්පාදනයන්

අමාත්‍යාංශයේ වතුයටිතල පහසුකම් සංවර්ධන අංශයේ ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය විසින් 2023 වසර සඳහා ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර තිබුණද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2(අ),(ආ) ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි. | 2023 වර්ෂය දක්වා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව සකස් කර ඇති අතර විස්තරාත්මකව සකසා නැත. | විස්තරාත්මක ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර ඒ අනුව අදාල ප්‍රසම්පාදන කටයුතු කල යුතුයි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 4.3 හා 4.4 ප්‍රකාරව, අමාත්‍යාංශයේ වාහනවලට අදාළ අභ්‍යන්තර අළුත්වැඩියාවන් පිළිබඳව | වතු යටිතල පහසුකම් සංවර්ධන අංශයේ බොහොමයක් වාහන වසර 05 කට වඩා පැරණි බැවින් වාහන අලුත්වැඩියා හා සේවා සඳහා නියෝජිත ආයතනයන් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුව ලංසු කැඳවා විධිමත් ක්‍රමවේදයකට අනුව හොදම මිල |

| | | | |
|---|---|---|---|
| | කටයුතු කළ යුතු වුවත්, අමතර කොටස්, බැටරි සැපයීම් හා ටයර් සැපයීම් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා ගැනීමෙන් තොරව රු.මිලියන 10 ක අළුත්වැඩියාවන් 82 ක් සිදුකර තිබුණි. | වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. මිල සැදැහුම් ක්‍රමයක් සඳහා යොමු වන්නේ යාන්ත්‍රික ඉංජිනේරු විසින් වෙනත් ආයතන මගින්මිල කැඳවීම් කරන ලෙස සඳහන් කළහොත් පමණි. | තෝරා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කළ යුතුයි. |
| (ඇ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 අනුව රු.මිලියන 2 ට අඩු ව්‍යාපෘති පමණක් ක්‍රියාත්මක කිරීම සඳහා සමිති සංවිධානයක් වෙත කොන්ත්‍රාත් පිරිනැමිය හැකිවේ. 2015 සිට 2023 කාලය තුල ක්‍රියාත්මක කර තිබූ, ඉහත කී උපරිම සීමාව ඉක්ම වූ ඇස්තමේන්තුගත වටිනාකම රු.මිලියන 5.5 ක් වූ නිවාස ව්‍යාපෘති 272 ක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් වැවිලි මානව සංවර්ධන භාරය විසින් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය අනුගමනය නොකර අමාත්‍යාංශ විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු. මිලියන 4000 ක් හා කළමණාකරණ ගාස්තු වශයෙන් රු.මිලියන 211 ක් ගෙවා තිබුණි. | අර්ධ වශයෙන් ඉදිකර ඇති වතු නිවාසවල ඉතිරි වැඩ කොටස් නිම කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2021 හි නියම කර ඇති කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.මිලියන 25 දක්වා වැඩි කර වතු සේවක සමිති වෙත කොන්ත්‍රාත් පිරිනැමීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු අතර වැවිලි මානව සංවර්ධන භාරය තම කාර්යභාරය නිසි පරිදි ඉටු නොකිරීම පිළිබඳ ගිවිසුම් ප්‍රකාරව අවශ්‍ය කටයුතු සිදුකළ යුතුයි. |

## 3.8 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ CIGAS පද්ධතියේ ඇතුලත්ව තිබූ රු.මිලියන 2.8 ක් වටිනා වෙනත් යන්ත්‍ර සහ උපකරණ අයිතම 62 ක් 2022 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සමීක්ෂණයේදී භෞතිකව පවතින බවට තහවුරු වී නොතිබුණි. | වත්කම් මේ වන විට අංකනය කිරීම සිදුකෙරෙමින් පවතින බැවින් ඉදිරියේදී මෙවැනි ගැටළු පැන නැගීම අවම වනු ඇත. | CIGAS පද්ධතියේ පවතින ස්ථාවර වත්කම්ද, භාණ්ඩ සමීක්ෂණයේදී භෞතිකව පවතින බවට තහවුරුකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2017 දෙසැම්බර් 21 දිනැති 02/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයෙහි 2(i) ඡේදයට පටහැනිව වෙනත් ආයතන 06 ක් නමින් ලියාපදිංචි කර තිබූ වටිනාකම රු.මිලියන 46 ක් වූ වාහන 13 ක් හා ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයත් රු.මිලියන 66 ක් වූ වාහන 6 ක් 2023 දෙසැම්බර් 31 වන විටත් අමාත්‍යාංශයේ කටයුතු වෙනුවෙන් භාවිතා කරමින් පැවතුණි. | මෙම වාහන 13 අමාත්‍යාංශයේ නමට ලියාපදිංචිය මාරු කිරීම සඳහා අදාළ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කර ඇති අතර එය කඩිනම් කර ගැනීම සඳහා අවස්ථා දෙකකදී සිහි කැඳවීම් යොමු කර ඇත. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වතුයටිතල පහසුකම් සංවර්ධන අංශය සතු වාහන 05 ක්, සෞම්‍ය මූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමට හා වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරිය වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබූ අතර වාහන 09 ක් 2022 වර්ෂයේදී නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට විධිමත් පැවරීමකින් තොරව ලබා දී තිබුණි. | සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමට සහ වැවිලි කලාපය සඳහා වූ නවගම්මාන සංවර්ධන අධිකාරියට වාහන 05 ක් තාවකාලිකව ලබාදී ඇත. නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයට ලබාදුන් වාහන 09 න් වාහන 03 ක් මෙම අමාත්‍යාංශය වෙත ලබාදී ඉතිරි වාහන 06 එම අමාත්‍යාංශයට පවරාගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. | බාහිර ආයතන වෙත ලබා දී ඇති වාහන ලබාගැනිමට හෝ විධිමත් පරිදි පවරා දිමට කටයුතු කළ යුතුය. |

## 3.9 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම (ii) හි පොත්වලින් කපා හැරීම පිළිබඳ ප්‍රකාශයෙහි අලාභයෙන් රු.14,430 ක් කපා නොහල ඉදිරියට ගෙනයන ශේෂය ලෙස දක්වා තිබුණද, වතු යටිතල පහසුකම් සංවර්ධන අංශයේ හානි පාඩු ලේඛනයට අනුව එම වටිනාකම 2019 නොවැම්බර් 06 දින පොතෙන් අස්කර තිබුණි. එමෙන්ම අලාභ සිද්ධීන් 02 ක් සඳහා රු.94,576 ක් හානි පාඩු ලේඛනයෙහි සටහන් කර නොතිබුණි. | රු.14,430 ක වටිනාකම අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇත. ඉදිරියේදී මෙය නිවැරදි කිරීමට කටයුතු කරමි. රු.94,576 ක මුදල අතපසුවීමකින් හානි පාඩු ලේඛනයෙහි සටහන් කර නොමැති බව දන්වා සිටින අතර පසුව එය නිවැරදි කිරීමට කටයුතු කරන ලදි. | මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තොරතුරු ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | රාජ්‍ය අමාත්‍ය කාර්යාලයට ලබා දී තිබූ රු. මිලියන 1.4 ක වටිනාකමකින් යුතු කැමරා උපකරණ, මුද්‍රණ යන්ත්‍රයක් හා ලැප්ටොප් පරිගණකයක් අමාත්‍යවරයාගේ දේශපාලන කාර්යාලයේ තිබී 2022 මැයි 09 දින විනාශ වී තිබූ අතර මෙම උපකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අවසර ගැනීමකින් තොරව අමාත්‍යාංශ පරිශ්‍රයෙන් පිටතට ගෙනයාම සම්බන්ධයෙන් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මු.රෙ.104(4) යටතේ පරීක්ෂා කර අවසන් වාර්තාව 2023 මැයි 11 භාර දී ඇත. නමුත් ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොතිබූ බව නිරීක්ෂණය වුයෙමි. 2024 අප්‍රේල් 19 දින නව නිලධාරීන් විසින් ලේකම්තුමා වෙත එම වාර්තාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මු.රෙ.104(4) ප්‍රකාරව මහා භාණ්ඩාගාරය වෙත දන්වන ලෙස දැනුම් දෙන ලදී. මෙම අලාභය සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීයෙකු පරීක්ෂණය මගින් හදුනාගෙන නොතිබුණි. | මෙම අලාභ හානි සම්බන්ධයෙන් වගකිව යුතු නිළධාරින් හදුනා නොගැනීම මුදල් රෙගුලාසිවලට පටහැනිව කටයුතු කිරිමක් බැවින් ඒ පිළිබඳ අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු අතර නිළධාරින්ගේ නොසැලකිලිමත් කම හේතුවෙන් රජයට පාඩු සිදු නොවිය යුතුය. |
| (ඇ) | 2015 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල අමාත්‍යාංශය සතු වාහන 08 කට අවස්ථා 10 කදී සිදුවූ අනතුරු සම්බන්ධයෙන් රු.මිලියන 4.6 ක අලාභයක් සිදුවී ඇති අතර එම අලාභ අයකර ගැනීමට විගණන දිනය වූ 2024 මාර්තු 05 දින වන විටත් අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි. | අවස්ථා 05 කදී සිදු වූ අලාභයන් වගකිව යුතු පාර්ශවයන්ගෙන් අයකර ගැනීමට කටයුතු කරනු ලබන අතර අවස්ථා 03 කදී සිදුවූ අලාභ සඳහා නෛතික ක්‍රියාමාර්ග ගැනීමටත්, අවස්ථා 02 කදී සිදුවූ අලාභ පොතෙන් කපා හැරීමටත් කටයුතු කරනු ලැබේ. | රිය අනතුරුවලට භාජනය වූ වාහනවල අලාභ කඩිනමින් අය කර ගැනිමට සහ නොසැලකිලිමත් කමින් රජයට පාඩුවක් සිදු වී තිබේද යන්න පරික්ෂාකර අදාළ වගකිවයුතු නිළධාරින් සම්බන්ධයෙන් අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගත යුතුයි. |

## 3.10 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 'සැමට ජලය' වැඩසටහන සඳහා 2022 වර්ෂයේදී ආනයනය කරන ලද පයිප්ප හා උපාංග සහිත කන්ටේනර් 122 ක් 2023 මැයි මස වන විටත් වරායෙන් නිදහස් නොකර වසරකට වැඩි කාලයක් ගත වී ප්‍රමාද වීම මත කන්ටේනර් 117 ක් වෙනුවෙන් පෞද්ගලික ආයතනයක් වෙත හා කන්ටේනර් 05 ක් සඳහා | සැමට ජලය වැඩ සටහන, රජයේ මුදල් ප්‍රතිපාදන මත, රජයේ පැවැති සෞභාග්‍යයේ දැක්ම මුල්කර ආරම්භ කරන ලද වැඩසටහනකි. අපේක්ෂිත පරිදි අක්මුදල් නොලැබීම මත මෙම පයිප්ප හා උපාංග නිශ්චිත කාල | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන, ව්‍යාපෘතින් ආරම්භකළ යුතු අතර රජයට සිදුවන මෙවැනි පාඩු වලක්වා ගැනිම සඳහා අදාල නිළධාරින් වගකීමෙන් යුතුව |

| | | | |
|---|---|---|---|
| | ශ්‍රී ලංකා වරාය අධිකාරියට වෙත ප්‍රමාද ගාස්තු ලෙස එකතුව රු.මිලියන 945 ක් 2023 වර්ෂය තුලදී නිශ්කාර්යව වැයකර තිබුණි. | වකවානුව තුල වරායෙන් නිදහස් කරගත නොහැකි විය. | කටයුතු කළ යුතුය. |
| (ආ) | ජල සම්පාදන අමාත්‍යවරයාට අනුයුක්ත කර තිබූ ජීප් රථයක් 2023 ඔක්තෝම්බර් 22 දින සිදු වූ අනතුර හේතුවෙන් දැඩිලෙස අලාභ හානි වී තිබුණි. එහෙත් එම වාහනය විගණන දිනය වූ 2024 අප්‍රේල් 10 දින වන විටත් අලුත්වැඩියාකර මුදල් රෙගුලාසි 103, 104 හා 105 ප්‍රකාරව වාහනයට සිදුවූ හානිය තක්සේරු කර ඊට වගකිව යුත්තන්ට එරෙහිව අවශ්‍ය විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර නොතිබුණි. | විනය විරෝධී ක්‍රියාවක් සිදු කර ඇති බව මු.රෙ පරීක්ෂණයේ දී සනාථ වී නැත. එබැවින් විනය පරීක්ෂණයක් සිදු කිරීමට ප්‍රමාණවත් සාධක නොමැති අතර මාර්ග අනතුරට අදාලව සිදුවන අධිකරණ ක්‍රියාමාර්ගයේ තීරණය අනුව ඉදිරි කටයුතු සිදු කරනු ඇත. | රථය කඩිනමින් අලුත්වැඩියා කිරීමට හා අනතුරට අදාළ පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය. එමෙන්ම විගණන විමසුම් මගින් දක්වා ඇති කරුණු පිළිබඳ නිසි පරීක්ෂණ සිදු නොකිරීම කළමණාකරන දුර්වලතාවයක් බව අවධානයට යොමු විය යුතුයි. |
| (ඇ) | දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව මාසික කුලී වටිනාකමින් සියයට 10 ක් අඩුකර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවත් එසේ කටයුතු කිරීමකින් තොරව වතු යටිතල පහසුකම් සංවර්ධන අංශය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වෙනුවෙන් අදාල ගොඩනැගිලි හිමියා වෙත මාසිකව රු.මිලියන 3 ක් බැගින් සමාලෝචිත වර්ෂය සඳහා රු.මිලියන 38.4 ක් ගෙවා තිබුණි. එයින් 2023 දෙසැම්බර් 31 වන විට එකතුව රු.මිලියන 2.6 ක මුදලක් දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | මෙම ගොඩනැගිල්ල හිමි Naleemiah Institute of Islamic Studies Society ආයතනය විසින් එම සියයට 10 ක මුදල ද ඇතුලත්ව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත ගෙවීම් කරන බැව් දන්වා ඇති බැවින් එසේ අඩු කිරීමක් සිදු නොකරන ලදි. | දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඈ) | සෞම්‍ය මූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනමේ හා වැවිලි කලාපය සඳහා වූ නව ගම්මාන සංවර්ධන අධිකාරියේ නිළධාරීන් තිදෙනෙකු සඳහා වතුයටිතල පහසුකම් සංවර්ධන අංශය සතු වාහන 03 ක් වෙන්කර දී තිබූ අතර තවත් සංචිත වාහන 07 ක් නිළධාරීන් 06 දෙනෙකු විසින් භාවිතා කර තිබුණි. | මෙම ආයතන සතුව වාහන නොමැති බැවින් එම ආයතනයන්හි කාර්යයන් සඳහා එහි සේවයේ නිරත නිලධාරීන් විසින් රාජකාරි අවශ්‍යතා මත වාහනයක් ඉල්ලුම් කරනු ලබන අවස්ථාවන්හිදී ප්‍රවාහන පහසුකම් ලබාදීමට ක්‍රියාකර ඇත. | විධිමත් පැවරීමකින් තොරව අමාත්‍යාංශය සතු වාහන වෙනත් ආයතන වෙත ලබා නොදිය යුතු අතර එසේ ලබා දීම හේතුවෙන් රජයට යම් පාඩුවක් සිදු වුවහොත් ඒ සම්බන්ධයෙන් අදාල නිළධාරීන් වගකිව යුතුය. |

| | | |
|---|---|---|
| (ඉ) 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර අවසන් කර තිබූ නිවාස ව්‍යාපෘති 112 ක් අදාල ගිවිසුම්ගත කාල සීමාව තුල සම්පූර්ණ කර නොතිබූ නමුත් ව්‍යාපෘති කළමණාකරණ ගාස්තු වශයෙන් වැවිලි මානව සංවර්ධන භාරය වෙත එකතුව රු.මිලියන 107 ක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | එකඟ වෙමි. 2024 වර්ෂය සඳහා වතු නිවාස වැඩසටහන වෙනුවෙන් වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය රු.මිලියන 500 ක් වන අතර, එම ප්‍රතිපාදන ප්‍රමාණය තුළ නිවාස ඒකක 383 ක ඉතිරි වැඩ කටයුතු ආරම්භ කිරීම සඳහා අනුමැතිය ලබා දී ඇත. අමාත්‍යාංශය විසින් නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් අදියර අනුව කළමනාකරණ ගාස්තු ගෙවා ඇත. | ගිවිසුම්ගත කාල සීමාව තුල එම නිවාස ව්‍යාපෘති සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය අධීක්ෂණය හා සම්බන්ධීකරණය නිසියාකාරව සිදු කළ යුතුය. |
| (ඊ) 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර අවසන් කර තිබූ නිවාස ව්‍යාපෘති 20 ක එසේ යතුරු භාරදුන් දිනයන් දක්වා නොතිබූ නමුත් ව්‍යාපෘති කළමණාකරන හා අධීක්ෂණ ගාස්තු වශයෙන් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු.මිලියන 16 ක ප්‍රමාණයක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. එසේම 2016 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා ක්‍රියාත්මක කර අවසන් කර තිබූ නිවාස ව්‍යාපෘති 65 ක යතුරු භාරදුන් දිනය මාස 06 කට වඩා කාලයක් ගතවී ඇති බවත් එම ව්‍යාපෘතිවලට කළමණාකරන ගාස්තු වශයෙන් වැවිලි මානව සංවර්ධන භාරය වෙත රු. මිලියන 61 ක ප්‍රමාණයක් අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණි. | එකඟ වෙමි. ඉදිරියේදී නිවාස ව්‍යාපෘතීන් හි වැඩ කටයුතු අවසන් වීමත් සමග ප්‍රතිලාභීන් වෙත යතුරු භාර දීමට කටයුතු කිරීමට සටහන් කර ගතිමි. අමාත්‍යාංශය විසින් වැවිලි මානව සංවර්ධන භාරය වෙත නිවාස ව්‍යාපෘතිවල ඉදිකිරීම් අදියර අනුව කළමනාකරණ ගාස්තු ගෙවා ඇත. | නිවාස ව්‍යාපෘතීන් හි වැඩ කටයුතු අවසන් වීමත් සමග ප්‍රතිලාභීන් වෙත යතුරු භාර දීමට කටයුතු කළ යුතුය. |

**4. තිරසර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වාර්ෂික කාර්යසාධන වාර්තාවට අනුව අමාත්‍යාංශය විසින් 2023 වර්ෂය සඳහා ප්‍රධාන තිරසාර සංවර්ධන අරමුණු 02 ක් යටතේ ඉලක්ක වැඩසටහන් 04 ක් හඳුනාගෙන තිබූ අතර එම වැඩසටහන්වල ප්‍රගතිය අත්පත්කර ගැනීම සියයට 3 සිට 52 දක්වා වූ අවම මට්ටමක පැවතුණි. | 2023 වර්ෂය තුළ වතු නිවාස ඉදිකිරීම සඳහා රු.මිලියන 500 ක ප්‍රතිපාදන පමණක් වෙන් කර තිබූ අතර මෙම ප්‍රතිපාදන තුළින් නිවාස විශාල ප්‍රමාණයක් සම්පූර්ණ කිරීමට නොහැකි විය. ඉදි කළ නිවාස සංඛ්‍යාව අවම මට්ටමක පැවති බැවින් ජල පහසුකම් ලබා දීමද සීමිත විය. | තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක ලඟා කර ගැනීමට කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2001 අගෝස්තු 22 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව උපරිම කාල සීමාව වන අවුරුදු 05 ක් එකම සේවා ස්ථානයේ සේවය කර ඇති සෑම නිලධාරියෙකුටම වෙනත් සේවා ස්ථානවල සේවය කිරීමට ඉඩදීම සඳහා වහාම ස්ථාන මාරු ලබා දිය යුතුව තිබුණද, එසේ නිලධාරින් 46 දෙනෙකු සඳහා ස්ථාන මාරුවීම් ලබා දීමට කටයුතු කර නොතිබුණි. | ස්ථාන මාරු ඉල්ලීම් මෙම අමාත්‍යාංශය විසින් නිර්දේශ කර රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත යොමු කිරීමට කටයුතු කර ඇත. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ස්ථානමාරු ලබා නොදෙන්නේ නම්, අමාත්‍යාංශයට ස්ථාන මාරුවීම් ලබා දීමට හැකියාවක් නොමැත. ඉතා අත්‍යාවශ්‍යම අවස්ථාවකදී හැර වාර්ෂික ස්ථාන මාරු ලබාදී තිබුණද අනුප්‍රාප්තිකයෙකු නොමැතිව කාර්ය මණ්ඩලය නිදහස් කිරීමට මේ වනවිට සිටින අවම කාර්ය මණ්ඩල ප්‍රමාණය අනුව නොහැකි වී ඇති බවද දන්වමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරණ ‘රාජ්‍ය වියදම් කළමණාකරණය’ පිළිබඳ ජනාධිපති කාර්යාල ලිපියේ 2.1 ඡේදය ප්‍රකාරව අමාත්‍යවරයාගේ හා නියෝජ්‍ය අමාත්‍යවරුන්ගේ කාර්යාලවල සේවයේ නියුක්ත කරවනු ලබන පෞද්ගලික කාර්ය මණ්ඩලයේ උපරිම සීමාව 15 ක් විය යුතු වුවත්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ කම්කරුවකු, මනු සටහන්කරුවකු සහ කළමණාකරන සහකාර නිළධාරියකු ඇතුළු නිළධාරීන් තිදෙනෙකු අමාත්‍යවරයාගේ රාජකාරි කටයුතු වෙනුවෙන් මුදා හැර තිබුණි. | ජල සම්පාදන මණ්ඩලයේ 2024 මැයි 06 දිනැති ලිපිය මඟින් මාධ්‍ය අංශය ජල සම්පාදන මණ්ඩලය යටතට ගැනීමට එකඟතාවත් ආදායම් සහකාර හා කළමණාකාර සහකාර යන නිලධාරීන් දෙදෙනා ජල සම්පාදන මණ්ඩලයට නිදහස් කරන ලෙසත් දන්වා ඇත. ඉදිරියේදී ඒ අනුව කටයුතු කිරීමට නියමිතය. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ඇ) | වතු යටිතල පහසුකම් සංවර්ධන අංශයේ අනුමත තනතුරු සංඛ්‍යාව 341 ක් වූ අතර කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති තාක්ෂණ නිලධාරීන් දෙදෙනා සමඟ තත්‍ය සේවක සංඛ්‍යාව 319 ක් වූයෙන් තනතුරු 22 ක් පුරප්පාඩුව තිබූ අතර ඉන් තනතුරු 07 ක්ම ජ්‍යෙෂ්ඨ මට්ටමේ වන අතර අමාත්‍යාංශයේ කටයුතු කාර්යක්ෂමව හා සඵලදායිව ඉටුකරගැනීමට මෙම තත්ත්වය බලපෑමක් ඇතිවිය හැකි බව නිරීක්ෂණය විය. | අමාත්‍යාංශයේ දැනට පවතින අත්‍යවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ ලේකම් හා ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙතින් අවස්ථා ගණනකදී ඉල්ලීම් කර ඇත. . | පුරප්පාඩුව තිබූ තනතුරු සම්පූර්ණ කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |